# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2004 අංක 2 දරන ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2004 ජනවාරි මස 06 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2004 ජනවාරි මස 09 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ **II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල **:** රු. 10.75 යි. තැපැල් ගාස්තුව **:** රු. 4.50 යි.

## 2004 අංක 2 දරන ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2004 ජනවාරි මස 06 වන දින]

එල්. ඩී.—ඕ. 44/2003.

**ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1**. මේ පනත 2004 අංක 2 දරන ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2**. මෙහි මින් මතු ප්‍රධාන ප්‍රඥප්තිය යනුවෙන් සඳහන් කරනු ලබන (420 වන අධිකාරය වූ) ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනතේ 5අ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— (420 වන අධිකාරය වූ) ලියාපදිංචි ස්කන්ධ සහ සුරැකුම්පත් ආඥාපනතේ 5අ වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ලෙස නැවත අංකනය කිරීමෙන් ;

(2) නැවත අංකනය කළ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් :–

> "(2) ලිඛිත සහතික ස්වරූපයෙන් නිකුත් කරනු ලබන භාණ්ඩාගාර බැඳුම්කර ගනුදෙනුවලට අදාළව, ප්‍රාථමික අලෙවිකරුවන් සහ නාමෝද්දිෂ්ට අලෙවිකරුවන් නොවන ලංසු තබන්නන් විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම සහ සමීක්ෂණය කිරීම මේ ආඥාපනතේ අන්තර්ගත වෙනත් යම් විධිවිධානයකට අගතියක් නොමැතිව, විශේෂයෙන් එහි 21ඇ, 21ඈ, 21ඉ සහ 21ඊ වගන්තිවල විධිවිධානවලට අගතියක් නොමැතිව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කරනු ලැබිය යුතු ය.".

**3**. ප්‍රධාන ප්‍රඥප්තියේ 21අ වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 21අ වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

" භාණ්ඩාගාර බැඳුම්කර. 21අ (1) සෑම භාණ්ඩාගාර බැඳුම්කරයක් ම, නිකුත් කරනු ලැබීමේ දී, ඒ බැඳුම්කරය නිකුත් කරනු ලබන්නේ යම් මුදල් ප්‍රමාණයක් සඳහා ද ඒ මුදල, මේ ආඥාපනතේ විධිවිධානවලට අනුකූලව, 4 වන වගන්තියට අනුව කරනු ලබන නියමයක නිශ්චිතව සඳහන් අනුපාතික මත ගණන් බලනු ලබන පොලිය ද සමඟ ඒ නියමයේ නිශ්චිතව සඳහන් දිනවල දී හෝ ඒ බැඳුම්කරය නිදහස් කර ගැනීම සඳහා ඒ නියමයෙන් රඳවාගෙන තිබෙන විකල්පයක් ප්‍රකාර හෝ ගෙවීමට එම බැඳුම්කරයෙන් ආණ්ඩුව බැඳී සිටින්නේ ය :

2-H 019294 - 4,500 (2003/09)

එසේ වුවද, එම ගෙවීම කළ යුතු වන දිනය ශ්‍රී ලංකා මහ බැංකුව ව්‍යාපාර කටයුතු සඳහා විවෘතව පවතින දිනයක් නොවුවහොත් එම ගෙවීම් කිරීම සඳහා නියම කරනු ලැබිය හැකි කාර්ය පටිපාටියකට අනුව ගෙවීම් කරනු ලැබිය යුතු ය.

(2) මේ ආඥාපනතේ වෙනත් කවර විධිවිධානයක් තිබුණ ද භාණ්ඩාගාර බැඳුම්කර ලිඛිත සහතික ස්වරූපයේ බැඳුම්කර වශයෙන් හෝ සහතික රහිත භාණ්ඩාගාර බැඳුම්කර ලෙස හෝ නිකුත් කරනු ලැබිය හැකි ය. ”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 21ඇ වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 21ඇ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ –

(අ) (ආ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :–

“ (ආ) ඒ ගිණුම් වලින්, සහතික රහිත භාණ්ඩාගාර බැඳුම්කර මත අයවිය යුතු මුල් මුදල, පොලිය හෝ බේරුම් මුදලක් වේ නම් එම මුදල්, ගනුදෙනුකරුවන්ට හෝ ඒ සඳහා හිමිකම තිබෙන තැනැත්තන්ට ගෙවිය යුත්තේ යම් කාලසීමාවක් ඇතුළත ද යන වග ; ”

(ආ) ඒ උපවගන්තියේ (ඉ) ඡේදයේ “ආකාරය සහ ක්‍රමය ” යන වචන වෙනුවට “ආකාරය සහ ක්‍රමය ;” යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ඇ) ඒ උපවගන්තියේ (ඉ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :–

“ (ඊ) ශ්‍රී ලංකා මහ බැංකුවට තොරතුරු සැපයීම සහ එම තොරතුරු සැපයිය යුතු ආකාරය, ක්‍රමය සහ කාලසීමා කවරේද යන වග.” ;

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් :–

" (4) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ගැසට් පත්‍රයේ සහ දේශීය පුවත්පත් දෙකක සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් පළ කරනු ලබන නිවේදනයක් මගින්, ලිඛිත සහතික ස්වරූපයෙන් නිකුත් කළ, ඒ නිවේදනයේ නිශ්චිතව සඳහන් කාණ්ඩයකට අයත් භාණ්ඩාගාර බැඳුම්කර, නියම කරනු ලැබිය හැකි යම් කාර්ය පටිපාටියකට අනුකූලව, සහතික රහිත භාණ්ඩාගාර බැඳුම්කර බවට පරිවර්තනය කිරීම සඳහා එම භාණ්ඩාගාර බැඳුම්කර දරන්නන්ගෙන්, ඔවුන් කැමති නම්, ආපසු භාර දෙන ලෙස නියම කරනු ලැබිය හැකි ය. එම භාණ්ඩාගාර බැඳුම්කර නියම කර ඇති ආකාරයට පරිවර්තනය කරනු ලැබූ විට, එය මේ ආඥාපනතට අනුකූලව නිකුත් කරනු ලැබූ, සහතික රහිත භාණ්ඩාගාර බැඳුම්කරයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) (4) වන උපවගන්තියේ අන්තර්ගත කිසිවක් ඒ උපවගන්තිය යටතේ පළ කරන ලද නිවේදනයක නිශ්චිතව සඳහන් කාණ්ඩයකට අයත් ලිඛිත ස්වරූපයෙන් නිකුත් කළ භාණ්ඩාගාර බැඳුම්කරයක් සඳහා ගෙවීම් කිරීමට මේ ආඥාපනත යටතේ ආණ්ඩුවේ බැඳීම කෙරෙහි බලපෑමක් ඇතිවන ලෙස හෝ එම බැඳීමෙන් නිදහස් වීමක් සිදුවන ලෙස අර්ථ කථනය නොකළ යුතු ය. ".

**5**. ප්‍රධාන ප්‍රඥප්තියේ 21ඈ වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර පහත දැක්වෙන වගන්තිය ඒ වෙනුවට ආදේශ කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 21ඈ වගන්තිය සංශෝධනය කිරීම.

" සෘජු සහභාගිකරුවන්. 21ඈ (1) (2) වන උපවගන්තියේ නිශ්චිතව දැක්වෙන පරිදි වූ සහතික රහිත භාණ්ඩාගාර බැඳුම්කර පිළිබඳව ගිණුම් පවත්වා ගැනීමට හිමිකම් තිබිය යුතු, ප්‍රාථමික අලෙවිකරුවකු හෝ වෙනත් තැනැත්තකු හෝ සෘජු සහභාගිකරුවකු ලෙස පත් කරනු ලැබීමට ශ්‍රී ලංකා මහ බැංකුවට හැකි ය.

(2) සෘජු සහභාගිකරුවකු විසින්, මුදල් නීති පනතේ සඳහන් රක්ෂිතාගාරයේ සහතික රහිත භාණ්ඩාගාර බැඳුම්කර සහ ඒ සෘජු සහභාගිකරුට හිමිකම තිබෙන වෙනත් සහතික රහිත බැඳුම්කර දැරීම සඳහා සහ සහතික රහිත භාණ්ඩාගාර බැඳුම්කරවල හා සහතික රහිත

වෙනත් සුරැකුම්පත්වල ඒ සෘජු සහභාගිකරුට පවත්නා බැඳියාවන් මුදල් නීති පනත යටතේ සාදනු ලබන රීති හා නියෝගවලට අනුකූලව වාර්තාගත කර තැබීම සඳහා, සහතික රහිත සුරැකුම්පත් ගිණුමක් පවත්වාගෙන යා යුතු ය.

(3) සෘජු සහභාගිකරුවකු විසින් (2) වන උපවගන්තිය යටතේ පවත්වාගෙන යන ගිණුම් වලින්, මුල් මුදල, පොලිය හෝ බේරුම් මුදලක් වේ නම් එම මුදල් ගෙවිය යුතු වන දිනයේ දී සෘජු සහභාගිකරු අයිතිකරු ලෙස වාර්තාගතව සහතික රහිත භාණ්ඩාගාර බැඳුම්කර වෙනුවෙන් මුල් මුදල, පොලිය සහ බේරුම් මුදල් ලෙස ගෙවිය යුතුව තිබෙන මුදල් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සෘජු සහභාගිකරුවකුට ගෙවනු ලැබිය යුතු ය.

(4) සෘජු සහභාගිකරුවකු විසින් ඊටම අයත් ගිණුමේ දරනු ලබන හෝ අලෙවිකාර සහභාගිකරුවකු සම්බන්ධයෙන් වන විට ඊටම අයත් ගිණුමේ මෙන්ම ගනුදෙනුකරුවන්ගේ ගිණුම්වල දරනු ලබන යම් සහතික රහිත භාණ්ඩාගාර බැඳුම්කර පිළිබඳව හෝ ඒ බැඳුම්කර කෙරෙහි බලපෑමක් සහිත යම් පොත්පත්, වාර්තා හෝ ගිණුම් පරීක්ෂා කිරීම හෝ ඒවායේ පිටපත් ලබාගැනීම, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කරනු ලැබිය හැකි ය. ශ්‍රී ලංකා මහ බැංකුවට අවශ්‍ය විය හැකි හා ඉල්ලා සිටිනු ලැබිය හැකි සියලු පොත්පත්, වාර්තා, හුවමාරු වූ ලිපි හෝ වෙනත් යම් ලේඛන, සෘජු සහභාගිකරු හෝ එහි නිලධරයන්, අධ්‍යක්ෂවරයන්, සේවානියුක්තයන්, සේවකයන් සහ නියෝජිතයන් විසින් සැපයිය යුතු අතර, සහතික රහිත භාණ්ඩාගාර බැඳුම්කර හා සම්බන්ධව මේ ආඥාපනතින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පැනවී තිබෙන කාර්ය ඉටුකිරීම සඳහා ඊට අවශ්‍ය සියලු සහාය ලබා දිය යුතු ය. මේ උපවගන්තියේ විධිවිධාන, විද්‍යුත් ස්වරූපයකින්, පවත්වාගෙන යනු ලබන යම් පොත්පත්, වාර්තා, ගිණුම් සහ ලිපි හුවමාරු කෙරෙහි ද අදාළ වන්නේ ය.

(5) සහතික රහිත භාණ්ඩාගාර බැඳුම්කරයක් වෙනුවෙන් ආණ්ඩුව යම් වගකීමකට යටත්වීමට හෝ මුල් මුදල, පොලිය හෝ බේරුම් මුදල වශයෙන් ගෙවීමක්

කිරීමට සිදුවන්නා වූ ද සෑජු සහභාගිකරුවකුගේ හෝ අලෙවිකාර සෑජු සහභාගිකරුවකුගේ හෝ බැහැර හැරීමක ප්‍රතිඵලයක් වශයෙන් හෝ පැහැර හැරීමක් හේතුකොටගෙන එම බැඳීම උද්ගත වන්නා වූ හෝ ගෙවීම කරනු ලබන්නා වූ ද අවස්ථාවක ආණ්ඩුව විසින් ඉල්ලා සිටිනු ලැබූ විට ඒ බැඳීම හෝ ගෙවීම සම්බන්ධයෙන් ආණ්ඩුවට හානි පූරණය කිරීමට ඒ සහභාගිකරු බැඳී සිටින්නේ ය.

මේ වගන්තියේ කාර්ය සඳහා "පැහැර හැරීම" යන්නට -

(අ) යම් සෑජු සහභාගිකරුවකු වෙත හෝ අලෙවිකාර සෑජු සහභාගිකරුවකු වෙත මේ ආඥාපනතින් හෝ මේ ආඥාපනත මගින් කටයුතු කෙරෙන යම් කාරණයකට අදාළ වෙනත් යම් ලිඛිත නීතියකින් හෝ පැවරී ඇති හෝ නියම වී ඇති යම් කර්තව්‍යයක් කිරීමෙහි හෝ කාර්යයක් ඉටු කිරීමෙහි ලා ඔහුගේ යම් නොසැලකිල්ලක් හෝ පැහැර හැරීමක් ; සහ

(ආ) මේ ආඥාපනත යටතේ වරදක් සංයුක්ත වන හෝ මේ ආඥාපනත අදාළ වන යම් කාරණයක් සම්බන්ධව වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ වරදක් සංයුක්ත වන සෑජු සහභාගිකරුවකුගේ හෝ අලෙවිකාර සෑජු සහභාගිකරුවකුගේ යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් -

(i) ඒ වරද සම්බන්ධයෙන් නඩු පැවරීමක් සිදු වී තිබුණ ද නොතිබුණ ද ; හෝ

(ii) ඒ ක්‍රියාව හෝ නොකර හැරීම සෑජු සහභාගිකරු විසින් හෝ අලෙවිකාර සෑජු සහභාගිකරු විසින් හෝ ඒ සෑජු සහභාගිකරුගේ නැතහොත් අලෙවිකාර සෑජු සහභාගිකරුගේ යම් අධ්‍යක්ෂවරයකු, නිලධරයකු, සේවා නියුක්තයකු හෝ අනුයෝජිතයකු විසින් හෝ කරන ලද්දක් වුව ද,

ඇතුළත් වේ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 21ඉ වගන්තිය සංශෝධනය කිරීම.

**6**. ප්‍රධාන ප්‍රඥප්තියේ 21 (ඉ) වගන්තිය, එහි (2), (3), (4), (5), (6), (7), (8), සහ (9) වන වගන්ති ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

" (2) 21ඈ වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ පවත්වාගෙන යා යුතු යයි නියමිත ගිණුම් පවත්වාගෙන යාමට අමතරව, අලෙවිකාර සෘජු සහභාගිකරුවකු විසින් එහි එක් එක් ගනුදෙනුකරු සඳහා සහතික රහිත භාණ්ඩාගාර බැඳුම්කර හා ඒ එක් එක් ගනුදෙනුකරුට හිමිකම තිබෙන වෙනත් සහතික රහිත සුරැකුම්පත් දැරීම පිණිස, සහ සහතික රහිත භාණ්ඩාගාර බැඳුම්කර හා සහතික රහිත වෙනත් සුරැකුම්පත්වලට ඒ එක් එක් ගනුදෙනුකරුගේ බැඳියාවන් සම්බන්ධයෙන් වාර්තාගත කිරීම පිණිස මුදල් නීති පනත යටතේ සාදන ලද නියෝගවලට හා රීතිවලට අනුකූලව, මුදල් නීති පනතේ සඳහන් රක්ෂිතාගාරයක ගිණුම් පවත්වාගෙන යා යුතු ය.

(3) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 21 ඈ වගන්තියේ (3) වන උපවගන්තියේ සඳහන් ගෙවීම්වලට අමතරව, අලෙවිකාර සෘජු සහභාගිකරුවකු විසින් (2) වන උපවගන්තිය යටතේ පවත්වාගෙන යන ගිණුම්වල මුල් මුදල, පොලිය හෝ බේරුම් මුදල් කිසිවක් වෙතොත් එම මුදල් ගෙවිය යුතු වන දිනයේ දී යම් සහතික රහිත භාණ්ඩාගාර බැඳුම්කරයක අයිතිකරු ලෙස ඒ අලෙවිකාර සෘජු සහභාගිකරුගේ යම් ගනුදෙනුකරුවකු වාර්තාගතව සිටී ද, එම ගනුදෙනුකරුට හිමි සහතික රහිත භාණ්ඩාගාර බැඳුම්කරවල මුල් මුදල, පොලිය හෝ බේරුම් මුදල් කිසිවක් වෙතොත් එම මුදල්, අලෙවිකාර සෘජු සහභාගිකරුට ගෙවිය යුතු ය.

(4) අලෙවිකාර සෘජු සහභාගිකරුවකු නොවන කිසිම තැනැත්තකු විසින්, වෙනත් යම් තැනැත්තකු වෙනුවෙන් සහතික රහිත භාණ්ඩාගාර බැඳුම්කර ගනුදෙනු කටයුතු නොකළ යුතු ය. සහතික රහිත භාණ්ඩාගාර බැඳුම්කර පැවරීමට හෝ තමන් වෙත පැවරීමක් ලබා ගැනීමට අපේක්ෂා කරන, සෘජු සහභාගිකරුවකු නොවන සහ ශ්‍රී ලංකා මහ බැංකුව නොවන යම් තැනැත්තකු විසින් එය අලෙවිකාර සෘජු සහභාගිකරුවකු මගින් පමණක් සිදු කළ යුතු ය.

(5) අලෙවිකාර සෘජු සහභාගිකරුවකු විසින් මේ ආඥාපනත යටතේ තම කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට හා ඉටු කිරීමට හැකිවනු පිණිස සහ එහි ගනුදෙනුකරුවන් වෙතට ඇති බැඳීම් ඉටුකළ හැකි වන පිණිස, පොත්පත් හා වාර්තා පවත්වාගත යුතු අතර, ඒ කාර්යය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කළ යම් විධාන ඇත්නම්, ඒ විධානවලට අනුව කටයුතු කළ යුතු ය.

(6) ගනුදෙනුකරුවකුගේ ගිණුමක දරනු ලබන සහතික රහිත භාණ්ඩාගාර බැඳුම්කර වෙනුවෙන් (3) වන උපවගන්තියට අනුකූල ගෙවීමක් වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවෙන් යම් මුදල් ප්‍රමාණයක් අලෙවිකාර සෘජු සහභාගිකරුවකුට ලැබුනු විටක, අලෙවිකාර සෘජු සහභාගිකරු එම මුදල ශ්‍රී ලංකා මහ බැංකුවේ යම් විධානයක නිශ්චිතව දැක්වෙන කාලය ඇතුළත අදාළ ගනුදෙනුකරුට හෝ එම ගෙවීම ලැබීමට නීතිය අනුව හෝ අලෙවිකාර සෘජු සහභාගිකරු සහ ගනුදෙනුකරු පාර්ශ්වකරුවන් වන යම් ලිඛිත ගිවිසුමකට අනුකූලව හෝ හිමිකම තිබෙන යම් පාර්ශ්වයකට ගෙවිය යුතු ය.

(7) ශ්‍රී ලංකා මහ බැංකුව නිකුත් කළ විධානවල දැක්වෙන කාලය ඇතුළත ගනුදෙනුකරුට හෝ (6) වන උපවගන්තියට අනුකූලව හිමිකම් තිබෙන පාර්ශ්වයකට ගෙවීම් කිරීමට අලෙවිකාර සෘජු සහභාගිකරුට යම් හේතුවක් මත නොහැකි වන්නේ නම්, අලෙවිකාර සෘජු සහභාගිකරු විසින් එම නොගෙවා ඉතිරිව තිබෙන මුදල, එකී විධිවිධානවල නිශ්චිතව දැක්වෙන යම් කාලසීමාවක් ඇතුළත, ශ්‍රී ලංකා මහ බැංකුවේ නියමිත ගිණුමකට මාරු කළ යුතු අතර එම ගෙවීම පිළිබඳව සහ අවස්ථාවෝචිත පරිදි ගනුදෙනුකරු හෝ වෙනත් පාර්ශ්වකරු පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුව නියම කරන තොරතුරු ශ්‍රී ලංකා මහ බැංකුව වෙත සැපයිය යුතු ය.

(8) 7 වන උපවගන්තියට අනුකූලව ශ්‍රී ලංකා මහ බැංකුවේ නියමිත ගිණුමකට මාරු කරනු ලබන මුදල් ප්‍රමාණයන්, ඒ සඳහා හිමිකම් ඇති තැනැත්තන්ට ගෙවනු ලැබිය යුතු අතර, හිමිකම් ඉදිරිපත් නොකර ඉතිරිව තිබෙන

යම් මුදල් ප්‍රමාණ පිළිබඳව, තත් කාර්යය සඳහා නියමිත පරිදි කටයුතු කිරීම හෝ සුදුස්සක් කිරීම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කරනු ලැබිය යුතු ය.

(9) ගනුදෙනුකරුවකු සඳහා පවත්වා ගෙන යන ගිණුම් පිළිබඳව හා ඒ හා සම්බන්ධ යම් කාරණයක් පිළිබඳව අලෙවිකාර සෘජු සහභාගිකරුවකු විසින් එහි ව්‍යාපාර කටයුතු හා පරිපාලනය නිසි පරිදි කරගෙන යාම සඳහා අවශ්‍ය ප්‍රමාණයට හැර, රහස්‍යභාවය පවත්වාගත යුතු අතර ගනුදෙනුකරු විසින් ලියවිල්ලක් මගින් බලය දෙනු ලැබුවහොත් හෝ යම් නීතියක් යටතේ නැතහොත් අධිකරණ නියෝගයක් මගින් නියමිතව ඇති අවස්ථාවක මිස, ශ්‍රී ලංකා මහ බැංකුවට හැර වෙනත් කිසිම තැනැත්තකුට ගනුදෙනුකරුවකුගේ ගිණුමක් පිළිබඳව කිසි තොරතුරක් හෙළිදරව් නොකළ යුතු ය.

(10) වෙනත් යම් අදාළ ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, අලෙවිකාර සෘජු සහභාගිකරුවකු මගින් ලබාගත් හෝ කරනු ලැබූ සියලු පැවරීම් වෙනුවෙන් එම අලෙවිකාර සෘජු සහභාගිකරු ගනුදෙනුකරුවන් සඳහා සම්පූර්ණයෙන් වගකිව යුතු හා බැඳී සිටිය යුතු ය. ”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 21ඊ වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**7**. ප්‍රධාන ප්‍රඥප්තියේ 21 ඊ වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, මෙහි පහත දැක්වෙන වගන්තිය ඒ වෙනුවට ආදේශ කරනු ලැබේ:—

“ සහතික රහිත භාණ්ඩාගාර බැඳුම්කර පැවරීම.

21 ඊ (1) 21 ඉ වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ ගනුදෙනුකරුවකු සඳහා පවත්වාගෙන යන ගිණුමකින් හෝ ගිණුමකට අලෙවිකාර සෘජු සහභාගිකරුවකු විසින් යම් සහතික රහිත භාණ්ඩාගාර බැඳුම්කරයක හිමිකම පවරනු ලැබූ අවස්ථාවක හෝ සහතික රහිත භාණ්ඩාගාර බැඳුම්කරයක යම් ගනුදෙනුකරුවකුගේ යම් බැඳියාවක් වාර්තාගත කරනු ලැබූ හෝ එවැනි යම් ගිණුමක සහතික රහිත භාණ්ඩාගාර බැඳුම්කරයක් පිළිබඳ යම් සංශෝධනයක් හෝ විචලනයක් කරනු ලැබූ අවස්ථාවක හෝ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කලින් කල නිකුත් කරනු ලැබිය හැකි යම් විධානවලට අනුකූලව, එම අලෙවිකාර සෘජු සහභාගිකරු විසින් අදාළ ගනුදෙනුකරුට ඒ පිළිබඳ තහවුරු කිරීමක් නිකුත් කළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවලින් සහතික රහිත සුරැකුම්පත් සඳහා රක්ෂිතාගාර පහසුකම් සපයන්නකුට, ඒ රක්ෂිතාගාරයේ පවත්වා ගෙන යන සහතික රහිත සුරැකුම්පත් ගිණුම් පිළිබඳ ප්‍රකාශ හෝ තහවුරු කිරීම් නිකුත් කිරීම සම්බන්ධයෙන්, මුදල් නීති පනත යටතේ පැනවී තිබෙන යම් බැඳීම්වල බලහීන කරන්නේ යයි අර්ථ කථනය නොකළ යුතු අතර, රක්ෂිතාගාරය විසින් එසේ නිකුත් කරනු ලැබූ ප්‍රකාශයක් හෝ තහවුරු කිරීමක් සහ (1) වන උපවගන්තිය යටතේ නිකුත් කළ යම් ප්‍රකාශයක් හෝ තහවුරු කිරීමක් අතර යම් ගැටීමක් හෝ අනනුකූලතාවක් පවත්නා විටක, රක්ෂිතාගාරය විසින් නිකුත් කළ ප්‍රකාශය හෝ තහවුරු කිරීම බලපැවැත්විය යුතු ය.

(3) 1 වන උපවගන්තියේ සඳහන් තහවුරු කිරීම ප්‍රමන්ත්‍රණයකට විෂය කරගත නොහැකි අතර, එය අදාළවන සහතික රහිත භාණ්ඩාගාර බැදුම්කර සම්බන්ධව එම අලෙවිකාර සෘජු සහභාගිකරු සහ ගනුදෙනුකරුවකු අතර ගනුදෙනු පිළිබඳ සාක්ෂි වශයෙන් පමණක් ප්‍රයෝජනයට ගනු ලැබිය හැකි විය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ නියමිත යම් නිවේදනයක්, තහවුරු කිරීමක් හෝ පිළිගැනීමක් හෝ ලදුපතක් ලිඛිතව නොවන ආකාරයකින් නිකුත් කළ හැකි බවට සහ එය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තත් කාර්යය සඳහා නිශ්චිතව සඳහන් කරන විදුලි පණිවුඩ, දුරකථන, චන්ද්‍රිකා, කේබල් හෝ වෙනත් යම් විද්‍යුත් චුම්බක හෝ දෘශ්‍ය මාධ්‍යයක් මගින් සම්ප්‍රේෂණය කිරීම හෝ භාරදීම කරනු ලැබිය හැකි බවට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අවසර දෙනු ලැබිය හැකි ය.

(5) සහතික රහිත භාණ්ඩාගාර බැඳුම්කරයක්, විද්‍යුත් මාර්ගයෙන් වාර්තාගත කිරීමක හෝ මේ ආඥාපනතේ කාර්ය සඳහා විද්‍යුත් ස්වරූපයකින් නිකුත් කරන හෝ පවත්වා ගෙන යන යම් තහවුරු කිරීමක, නිවේදනයක, පිළිගැනීමක, ලදුපතක හෝ වෙනත් ලේඛනයක හෝ වාර්තාවක නෛතික බලපෑම, වලංගුභාවය හෝ බලාත්මක කරනු ලැබීමේ හැකියාව, හුදෙක් එම සහතික රහිත භාණ්ඩාගාර බැඳුම්කරය විද්‍යුත් ස්වරූපයකින් පවත්වා

ගෙන යාමේ හෝ එම තහවුරු කිරීම, නිවේදනය, පිළිගැනීම, ලදුපත හෝ වෙනත් ලේඛනය හෝ වාර්තාව විද්‍යුත් ස්වරූපයකින් නිකුත් කිරීමේ හා පවත්වාගෙන යාමේ හේතුව මත නොපිළිගෙන ප්‍රතික්ෂේප නොකළ යුතු අතර, 1995 අංක 14 දරන සාක්ෂි (විශේෂ විධිවිධාන) පනතේ II වන සහ III වන කොටස්වලට අනුකූලව හෝ යම් අධිකරණයක් හෝ විනිශ්චය අධිකාරයක් ඉදිරියේ පරිගණක සාක්ෂි ඉදිරිපත් කිරීම හා සම්බන්ධ තත්කාලීනව බලපවත්නා වෙනත් යම් නීතියකට හෝ අනුකූලව යම් අධිකරණයක හෝ විනිශ්චය අධිකාරයක පැවැත්වෙන නඩු කටයුත්තක දී ඒ තහවුරු කිරීම, නිවේදනය, පිළිගැනීම, ලදුපත හෝ වෙනත් ලේඛනය, සාක්ෂි වශයෙන් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය. ”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තිය සංශෝධනය කිරීම.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියට ඉක්බිතිව ම මෙහි පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

“ (1අ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වරින් වර නිකුත් කරන විධානවලට අනුකූලව, ප්‍රාථමික අලෙවිකරුවන් විසින් හෝ වෙනත් බලයලත් තැනැත්තන් විසින් ගනුදෙනුකරුවන් සඳහා භාරයක් ලෙස දරනු ලබන භාණ්ඩාගාර බැඳුම්කර, රෙජිස්ට්‍රාර්වරයා විසින් හෝ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් හෝ පිළිගනු ලැබීමට (1) වන උපවගන්තියේ විධිවිධාන බාධකයක් නොවිය යුතු ය. ”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 55 වන වගන්තිය සංශෝධනය කිරීම.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 55 වන වගන්තිය. එහි (2) වන උපවගන්තියට ඉක්බිතිව ම, මෙහි පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

“ (2අ) මේ ආඥාපනත යටතේ නිකුත් කරනු ලබන, සහතික රහිත භාණ්ඩාගාර බැඳුම්කර, මේ ආඥාපනත යටතේ සාදනු ලබන නියෝගවල විධිවිධාන සලස්වා තිබෙන පරිදි පැවරීම, ඔඩපනය කිරීම, බැඳීමකට යටත් කිරීම, ණයට දීම, ණයට ගැනීම හෝ අන්‍යාකාරව ඒ පිළිබඳව ගනුදෙනු කිරීම, කරනු ලැබිය හැකි අතර, ඒ

අනුව සිදු කරන ලද යම් පැවරීමක්, ඔඩපනය කිරීමක්, බැඳීමකට යටත් කිරීමක්, ණයට දීමක්, ණයට ගැනීමක් හෝ වෙනත් යම් ගනුදෙනු කිරීමක්, ලිඛිත සහතික ස්වරූපයෙන් නිකුත් කරන භාණ්ඩාගාර බැඳුම්කර පිළිබඳ ගනුදෙනුවලට අදාළව වෙනත් යම් නීතියක කුමක් සඳහන්ව තිබුණ ද වලංගු හා බල සහිත වන්නේ ය. ”.

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 56අ වගන්තිය, එහි (2) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 56අ වගන්තිය සංශෝධනය කිරීම.

“ (2) මේ ආඥාපනත යටතේ වරදක් කරන යම් තැනැත්තකු මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, අවුරුදු පහක් නොඉක්මවන කාලයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ රුපියල් මිලියන දහයක් නොඉක්මවන දඩයකට හෝ ඒ වරද කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් යම් තැනැත්තකුට මූල්‍යමය අලාභයක් හෝ මූල්‍යමය ලාභයක් හෝ මුදලින් ප්‍රමාණ කළ හැකි අලාභයක් නැතහොත් ලාභයක් හෝ විඳින්නට සිදුවී ඇති අවස්ථාවක එම අලාභයේ හෝ ලාභයේ ප්‍රමාණය මෙන් දෙගුණයක් හා සමාන දඩයකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඒ තැනැත්තා යටත් වන්නේ ය.

(3) මේ පනත යටතේ යම් වරදක් සිදු කරන ලද්දේ කවර අවස්ථාගත තත්ත්වයක් යටතේ ද යන කාරණය සැලකිල්ලට ගෙන, ශ්‍රී ලංකා මහ බැංකුව විසින්, අධිකරණයේ එකඟත්වය ඇතිව, එම වරද රුපියල් මිලියන පහක් නොඉක්මවන මුදල් ප්‍රමාණයකට හෝ එම වරදෙහි ප්‍රතිඵලයක් වශයෙන් යම් තැනැත්තකුට මූල්‍යමය අලාභයක් හෝ මූල්‍යමය ලාභයක් හෝ මුදලින් ප්‍රමාණ කළ හැකි අලාභයක් නැතහොත් ලාභයක් විඳින්නට සිදු වී ඇති අවස්ථාවක, එම අලාභයේ හෝ ලාභයේ අගය මෙන් එකහමාරක මුදල් ප්‍රමාණයකට සමාන මුදල් ප්‍රමාණයකට සමථයට පත් කළ හැකි ය.

(4) මේ වගන්තිය යටතේ වරදක් සමථයට පත් කිරීම නිදොස් කිරීමක් ලෙස බලපැවැත්විය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 58 වන වගන්තිය සංශෝධනය කිරීම.

**11**. ප්‍රධාන ප්‍රඥප්තියේ 58 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) "ගනුදෙනුකරු" යන්නෙහි අර්ථ කථනය වෙනුවට, පහත දැක්වෙන අර්ථ කථනය ආදේශ කිරීමෙන් :—

"ගනුදෙනුකරු" යන්න, අලෙවිකාර සෘජු සහභාගිකරුවකු සම්බන්ධයෙන් යෙදෙන විට, ඒ අලෙවිකාර සෘජු සහභාගිකරු මගින් සහතික රහිත භාණ්ඩාගර බැඳුම්කර හෝ ඒවායේ යම් බැඳියාවක් මිල දී ගන්නා හෝ විකුණන හෝ අන්‍යාකාරයකින් අත්කර ගන්නා හෝ බැහැර කරන යම් තැනැත්තෙක් හෝ ඒ බැඳුම්කර නැතහොත් ඒවායේ යම් බැඳියාවක් අත්කර ගැනීමේ හෝ බැහැර කිරීමේ හැකියාව ගැන ඒ අලෙවිකාර සෘජු සහභාගිකරු සමඟ ප්‍රමන්ත්‍රණය කරනු ලබන යම් තැනැත්තෙක් ඉන් අදහස් වන අතර, පද සම්බන්ධය අනුව අවශ්‍ය අවස්ථාවල දී ඒ ගනුදෙනුකරුගේ නීත්‍යනුකූල අනුයෝජිතයෙක් හෝ ඒ ගනුදෙනුකරුගේ බූදලයේ නීත්‍යනුකූල අනුයෝජිතයෙක් ඊට ඇතුළත් වේ. "

(2) "මුදල් නීති පනත" යන යෙදුමෙහි අර්ථ කථනය වෙනුවට පහත දැක්වෙන අර්ථ කථනය ආදේශ කිරීමෙන් :—

"මුදල් නීති පනත" යන්නෙන්, වරින්වර සංශෝධිත පරිදි වූ (422 වන අධිකාරය වන) මුදල් නීති පනත අදහස් වන අතර, එයට ඒ පනතේ අන්තර්ගත කාරණාවලට අදාළව ඒ පනත ප්‍රතියෝජනය කරන යම් නීති ප්‍රඥප්තියක් ද ඇතුළත් වන අතර, ඒ පනතේ යම් වගන්තියක් පිළිබඳව මේ ආඥාපනතේ නිශ්චිතව සඳහන් වන අවස්ථාවක, ඒ සඳහන, තදනන්තර නීති ප්‍රඥප්තියේ අනුරූප වගන්තිය පිළිබඳ සඳහනක් ඇතුළත්වන ලෙස සැලකිය යුතු ය.

"සුරැකුම්පත් ගිණුම" යන්නෙහි, (422 වන අධිකාරය වන) මුදල් නීති පනතේ ඊට දී ඇති අර්ථයම ඇත්තේ ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**12**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.